14 වන පිටුවෙන් (අදිසි)

තබා ගන්නා අතර ය. කිසිවකු කාමරයට ඇතුල් වනු හා තමා ඉදිරියේ සිටගනු ඇයට දැනෙයි.

"මැඩම්.." ඒ කටහඬ ඇයට හොඳින් පුරුදු ය. ඕ හිස ඔසවා බලයි.

"අයේෂා..?"

අයේෂා සිනාවක් මුවගට නංවාගන්නට වෑයම් කරයි. අයෝමා වාඩි වන්නැයි ඇයට අතින් සන් කරයි. තමා ඉදිරියේ වාඩි වන යුවතිය අයෝමාගේ සිතේ ඇති කරන්නෙ විමතියකි. තමා පළමු දිනයේ දකින විට සිටි කෙළිලොල් පෙනුම ඈ වෙතින් පලාගොස් ඇතිවා සේ ය. ඒ වෙනුවට ඇගේ මුහුණ පුරා ඇඳී ඇත්තේ දැඩි විඩාපත් බවකි. සුදුමැලි මුහුණ වැහැරී ගොස් ඇත්තා සේ පෙනෙයි.

"සනීප නැතුව උන්නද..?" අයෝමා අසන්නේ එනිසා ය.

ඇගේ ප්‍රශ්නයට පිලිතුරක් දෙනු වෙනුවට

***"වෙල් ඩන්.. අයි ගොට් ද නිව්ස්... වෙල් ඩන්.." ඔහුගේ කටහඬෙහි ඇති උද්යෝගය ඇයට දැනෙයි. සාකච්ඡාව නිමවී විනාඩි පහක් යන්නටත් පෙර ඔහු සියල්ල දැනගෙන තිබීම පුදුමයට කරුණක් නොවේ. සිය පරිසරයේ සෑම අස්සක් මුල්ලක් නෑරම ඔහු ගේ අනවරත අවධානයට ලක්ව තිබෙන බව ඇය අත්දැකීමෙන් දනියි. "...අද රෑ කෑම හිල්ටන් එකෙන්.. එක්සලන්ට් ජොබ් එකක් ඉවර කළාට මගෙන් ට්‍රීට් එකක්.."***

අයේෂා අත් බෑගය විවෘත කර අතට ගන්නා අත් ලේන්සුවෙන් දෑස් පිසදමා ගනියි.

"මැඩම්.." අයේෂා යමක් කියන්නට තැත් කරයි.

"කියන්න..."

අයේෂා නැවතත් කඳුලු පිස දමයි.

"කියන්න.." අයෝමා නැවතත් කියයි.

"මට... මට මේක කියන්න කෙනෙක් නෑ මැඩම්.. ඒත් කවුරු හරි මේක දැනගෙන ඉන්න ඕනෙ.. හුඟක් කල්පනා කරල අන්තිමේ මං හිතුව මැඩම්ට මේක කියනවා කියල .."

"ඇයි මට...? ඔයාගෙ පෞද්ගලික දෙයක් කියන්න තරම් අපි අතරේ ඒ හැටි හිතවත් කමක් තිබ්බෙ නෑනෙ අයේෂා.." අයෝමා සිය සැප අසුනේ පසු පසට ඇදී වාඩි වී සිටි ඉරියව්ව වෙනස් කරයි. මේ ඉරියව්වේදී වඩා ඉහළ අධිකාරී බලයක් ප්‍රදර්ශනය කළ හැකි ය.

අයේෂා කතාව නවත්වා කල්පනාවක වැටී සිටියි. ඇයු සුසුමක් හෙළණු අයෝමාට පෙනෙයි.

"මේ වෙලාවෙ රණසිංහ මහත්තයට බලපෑමක් කරන්න පුලුවන් එකම කෙනා මැඩම් විතරයි.." අයේෂා පහත් හඬින් කියයි. "..ඒකයි මං මේක ඔයාට කියන්න හිතුවෙ.. "

"මම..? රණසිංහ මහත්තයට..? මොකක් ගැනද..?"

අයේෂා නැවතත් කල්පනාවකට වැටෙයි.

"කියන්න.. "

අත් ලේන්සුවෙන් දෑස් පිසදමා ගන්නා අයේෂා බිම බලා ගනියි. තමාට කරන්නට සිදුව ඇති හෙළිදරව්ව සඳහා සුදුසු වචන සොයාගත නොහැකිව.. සොයාගත් වචන පිට කර ගත නොහැකිව.. විනාඩි කීපයක් බිම බලා සිටින්නට ඇයට සිදුවෙයි.

"මැඩම්.. මැඩම්... මට... දරුවෙක්... "

"මොකක්..?" අයෝමා අසන්නේ විමතියෙනි.

"මට... මට දරුවෙක් ලැබෙන්න ඉන්නවා.."

"කාගෙන්ද..? කාගෙද දරුවා..?" අයෝමාගෙ දැඩි ස්වරය විසින් නිහඬ කරවනු ලැබූ යුවතිය කිසිවක් නොකියා බලා සිටියි. අයෝමා යමක් අනුමාන කරයි. ඒ අනුමානය තහවුරු වුව ද පදුමයක් නැත. "කියනවා... දරුව රණසිංහගෙ ද..?"

අයෝමා දකුණතේ ඇඟිලි තුඩු වලින් නළල පිරිමැද ගනියි. කල්පනා කරන්නට අදහස් ගොණු කරගන්නට විනාඩි කීපයක් අවශ්‍ය ය. මේ ආරංචිය බෝම්බයකටත් වඩා දරුණු ය. රණසිංහ ගේ සමස්ත ඡන්ද ව්‍යාපාරයම කඩා බිඳ දමන්නට මේ ප්‍රවෘත්තියට හැකියාව ඇති බව අයෝමා දනියි. එය අනියම් ලෙස ප්‍රඥාරත්න කෙරෙහිද ඔහු හරහා තමා කෙරෙහිද යම් බලපෑමක් කරන්නට ඉඩ ඇත.

"තව කවුද මේක දන්නෙ..?" අයෝමා අසන්නේ පහත් හඬකින් ය.

"කවුරුත් දන්නෙ නෑ.."

"අම්මලාවත් දන්නෙ නැද්ද..?"

"අනේ දෙයියනේ කාටවත් කටක් ඇරල කියන්නෙ කොහොමද මැඩම්.."

එය සුබාරංචියකි. රහස තවමත් රැකී ඇත. අයෝමා සැනසුම් සුසුමක් හෙළයි. පුටුවෙන් නැගිටින ඇය කාමරයේ දොර අසළට ඇවිද ගෙන යයි. දොරෙන් පිටත ශාලාව දෙස වරක් එබී බලයි. කිසිවකු පිටත නැති බව තහවුරු කරගනිමින් ඇය නැවත හැරී අයේෂා වෙත එයි.

"අද මං හමුවෙන්න එනව කියල කාටවත් කිව්වද..?"

"නෑ මැඩම්.. මං වෙනද වගේ වැඩට යන විදිහටම ආවෙ.."

"ඒක හොඳයි.. " අයෝමා නැවත සිය අසුනේ වාඩි වෙයි. "මං රණසිංහ මහත්තය හමුවෙලා කතා කරන්නං.. කතා කරල සුදුසු වැඩ පිලිවෙලක් දාන්නං.. එයාට මං ලේසියෙන් මග අරින්න දෙන්නෙ නෑ.. තේරුනාද..? එතකල් අයේෂා මේ රහස රැකගෙන ඉන්න ඕනෙ.. තේරුණා ද..? ගෙදර ඉන්න බැරි නං මං නවතින්න තැනක් ලෑස්ති කරන්නං.." අයෝමා දෑත් මේසය මත තබා අයේෂා දෙසට ඇදී පහත් හඬින් කියයි.

"මැඩම්.."

"ඔව්.. කිසිම දේකට කලබල වෙන්ඩ එපා.. මං ඔක්කොම බලා ගන්නං.. අයේෂා දැන් යන්න" අයෝමා සැප පුටුවේ පිටුපසට බර වී දෑස් පියා ගනියි. විවේකයක් අවශ්‍ය ය. දැන් බොහෝ දේ කල්පනා කළ යුතුව ඇත. අයේෂා කාමරයෙන් පිටව යන හඬ ඇයට ඇසෙයි.

ජංගම දුරකතනය අතට ගන්නා අයෝමා අංකයක් ඔබයි. ඒ ප්‍රඥාරත්න ගේ අතිශය රහසිගත දුරකතන අංකයයි.

"මට හමුවෙන්න ඕනෙ... ඔව්... මේ දැන්ම.."

*ළබන කළාපයට*

# වෙස්ටර්න් ලංකා ස්පයිසස්

**WERRIBEE**
**HOPPERS**
**POINTCOOK**
**ALTONA**
**TARNEIT**
**WYNDHAMVALE**



ප්‍රදේශවාසී ඔබගේ
ශ්‍රී ලාංකික වෙළඳ සැල

**පෙ.ව 10.00 සිට රාත්‍රී 7.00 දක්වා**
**බ්‍රහස් - සිකුරාදා පෙ.ව 10.00 සිට රාත්‍රී 8.00 දක්වා**
**සතියේ දින 7 ම විවෘතයි**

NO 4 QUARBING ST
WERRIBEE
MELWAY - 205 F 6
**TP - (03) 9742 2487**
**Mob - 04 0233 5450**




0433638610

# WESTERN LANKA SPICES
## Werribee

12 වන පිටුවෙන් (කුට්ටම් පොකුණ)

ආතතිය තිබුණේ පහත් අඩියකය. (Moral) ඒ කාලයේ බොහෝ පිරිසක් හමුදාව අතහැර ගොස් සිටියහ. කිසිදාක කොටින් සමඟ සාකාච්ඡාවෙන් ප්‍රශ්නය විසඳගන්නට බැරි බව දත් ජනාධිපතිවරයා මුලින්ම කලේ යුද්ධයට ඇති දක්ෂ සේනා සමූහයක් හමුදාවට සම්බන්ධ කර ගැනීමයි. සරත් ෆොන්සේකා මුල සිටම කීවේ මෙය මුලින්ම යුද්ධයෙන් විසඳා පසුව දේශපාලනමය විසඳුමක් දිය යුතු බවයි. මහින්ද චින්තනය අනුවද ඔහු ජනතාවට පොරොන්දු වූයේ කොටි සංවිධානයෙන් රට බේරාගෙන මුළු රටම එක් සේසත් කරන බවයි. එහෙත් ප්‍රභාකරන් ඇතුළු කොටි බුද්ධි අංශය මහින්ද ගැන අඩු තක්සේරුවක් තබාගෙන සිටියහ. ඔවුන් සිතුවේ මහින්ද යනු ජාත්‍යන්තර සහයෝගය දිනාගත නොහැකි සියළු ප්‍රශ්න අනාගන්නා ජන නායකයෙකු ලෙසය. ජනාධිපතිවරණයේදී දෙමළ ඡන්ද වර්ජනය කර මහින්දට බලයට ඒමට ඉඩ සැලැස්සූ කොටි ඊළඟ පිම්ම මහින්ද හරහා පනින්නට ලක ලැහැස්ති වූහ. එහෙත් කොටින්ට වැරදුන තැන එතැනය. එසේම ඒ කාල වකවානුව තුළ ඔවුන් සූදානම් කළ මරාගෙන මැරෙන ප්‍රහාර බොහොමයක් අසාර්ථක විය. සටන් ක්‍රම හා උපායමාර්ග වතුරේ දිය විය. මාවිල්ආරු වේල්ලෙන් සටන පටන්ගත් මහින්ද එය නොනවතින රැල්ලක් බවට පත් කර ගත්තේය. අන්තිමේදී ප්‍රභාකරන්ගේ ලේද වතුරට දියවී ගියේය. තමා ගැනත් කොටි සංවිධානය ගැනත් අධි තක්සේරුවක් තබාගෙන සිටි ප්‍රභාකරන්ගේ පුහු මානය මෙලෙස දියවී යාමට මේ සියළු දෙනා මෙන්ම ජාත්‍යන්තරයේ සිටින අපගේ සිංහල මෙන්ම සමහර ද්‍රවිඩ ප්‍රජාවගේ ද නොමඳ සහය හිමිවූ බව අප දැනගත යුතු කරුණකි. ඒ සියලු දේටත් වඩා අපේ රටේ අහිංසක තරුණ තරුණියන් හමුදාවට බැඳී ජීවිත පූජාවෙන් සටන්කළ නිසා මෙම ප්‍රශ්නය මෙසේ බේරාගැනීමට අපිට පුළුවන් විය. රජවරුන් සේනාධිපතින්ට වඩා අතපය අහිමි කරගත් ඇස් කන් නාස අහිමිකරගත්, ඊටත් වඩා ජීවිත අහිමි කරගත් දහස් ගණනක් මේ තීරය පිටුපස ඇත. ඔවුන්ගේ නම් ගම් කිසිදාක ගල්කුළුණු මත සටහන් වන්නේ නැත. අතීතයේ සේම වර්තමානයේත් එලෙසමය. ඔවුන්ට අප හිස නමා ආචාර කළ යුතුය. ඔවුන්ට ගරු කිරීමක් වශයෙන් කළ යුත්තේ මෙම ප්‍රශ්නයට සාධාරණ දේශපාලන විසඳුමක් ලබා දී යලිත් මෙවැන්නක් සිදුනොවන්නට කටයුතු සැලැස්වීමයි. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාට තවමත් එම හැකියාව ඇත. යුද්ධය කළාසේම අනාගත සාමයටත් ඔහු සැලසුම් සකස් කළ යුතුය.

ඒ නිසා මෙම යුද්ධය යුද්ධයක් ලෙසම පවත්වාගෙන යාමට උනන්දුවක් දැක්වූ ප්‍රභාකරන්ලාගේ විනාශය යම් දිනක සිදුවන බව අපි කවුරුත් දැන ගෙන සිටි කාරණයකි. දෙමළ ජනතාව බිල්ලට තබාගෙන තම ජාතියත් ඔවුනුත් විනාශ කරගනිමින් ප්‍රභාකරන් රඟ පෑ මේ නාටිකාව අදින් අවසන් වන්නේ නැත. එහි නශ්ටාවශේෂ තවමත් තැන් තැන්වල ඉතිරිව පවතී. එහෙත් ඒවාට ලැබෙන ආයුෂ ප්‍රමාණය අඩුවන්නේ ලබාදෙන සාධාරන දේශපාලන විසඳුම් හරහාය. එසේ නොවුවහොත් පරෙවි වෙසින් වෙස් ගන්නා පරෙයියන් අපේ රට විනාශ කිරීමට මාන බලනු ඇත.

ප්‍රභාකරන් වැනි මිනිසුන් ගැනත් වත්මන් නායකත්වය ගැනත් මෙම යුද්ධය ගැනත් අපේ රට පෙර පාලනය කළ ජනාධිපතිවරු ගැනත් කදිම නිදසුනක් ජාතක කථා සංග්‍රහයේ එන තයෝධර්ම ජාතක කථාවෙන් අපිට ලබා දීමට වෑයම් කරයි. ඒ ප්‍රඥාව වීර්යය එඩිතර බව හා උපාය ඥානය යන ගුණාංග එක් රැස් කර ගත් පුද්ගලයා අන්තිමේදී තම සතුරන් හා බාදා ජය ගන්නා බවයි. වර්තමාන ජනාධිපතිවරයාට තව ජය ගැන්මට බොහෝ බාධක ඇතත් ඔහු බොහෝ සතුරන් ජයගෙන මෙම ප්‍රඥාව කරා ළඟා වී ඇති බව අපිට පෙනේ.